# ඉතිහාස පර්යේෂණ සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී.එම්.සී. මධුසංඛ බණ්ඩාර

*මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*
madusankabandaranayaka42@gmail.com

**සංක්ෂේපය**

මානව වර්ගයාගේ අඛණ්ඩ දීර්ඝ ඉතිහාසය නැවත ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ඓතිහාසික මූලාශ්‍රයගත සාධක අධ්‍යයනය කිරීම අතිශය වැදගත් වේ. මෙවන් මූලාශ්‍ර පරිශීලනයේදී මානව වර්ගයාගේ පුළුල් සංදර්භගත ඉතිහාසයක් අපට හෙළිදරව් වන අතර මෙම මූලාශ්‍ර පරිහරණයෙහිලා ප්‍රබලතම සේවාවක් සපයන රාජ්‍ය ආයතනයක් වශයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව දැක්විය හැකිය. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යනු සංස්කෘතික දායාදයේ කොටසක් ලෙස රාජ්‍ය ලේඛන විධිමත් ලෙස කළමනාකරණය සහ සංරක්ෂණය කරනු ලබන ආයතනයයි. ඉතිහාස පර්යේෂණ සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහනුවර ශාඛා කාර්යාලය තුළ තැන්පත් ලේඛන භාවිතය මගින් ලබා දෙන දායකත්වය කෙබඳුද? යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවයි. එසේම මහනුවර ශාඛා කාර්යාලය තුළින් ලබා දෙන ප්‍රායෝගිකමය දායකත්වය සහ එම දායකත්වය ඉතිහාස පර්යේෂණ ක්‍රියාවලියෙහිලා සිදු කරන ලද බලපෑම පිළිබඳව හඳුනා ගැනීම මෙම පර්යේෂණය සිදු කිරීමේ මූලික අරමුණ විය. මෙම පර්යේෂණය තුළදී භාවිත කරන ලද අධ්‍යයන ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. එහි දී පර්යේෂණය සඳහා තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළට ඇතුළත්ව පවතින ඓතිහාසික සම්පත් විශ්ලේෂණය කරමින් ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රන් භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රායෝගික ක්‍රමවේදය සහ න්‍යායාත්මක ක්‍රමවේදය භාවිත කළ අතර දත්ත එකතු කිරීම, දත්ත හඳුනාගැනීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ නිගමනවලට එළඹීම ආදිය ඔස්සේ පර්යේෂණය සිදු කරන ලදී. මෙම පර්යේෂණය තුළින් පර්යේෂකයාට සුවිශේෂී ප්‍රතිඵල රැසක් අනාවරණය කරගත හැකිවිය. රාජ්‍යය ආයතනයන්හි බිහිවන ලේඛන ස්ථිර සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාගාරය වෙත ආබද්ධ වේ. ඉතිහාස පර්යේෂකයන් සඳහා තොරතුරු සමුද්ධරණයෙහිලා මහනුවර ශාඛා කාර්යාලය තුළින් විවිධ පර්යේෂකයන්ගේ උපාධීන්, පශ්චාත් උපාධි අවශ්‍යතාවයන් සඳහා අවැසි මූලාශ්‍රමය දායකත්වය ලබා දීමත්, රජයේ විවිධ ප්‍රකාශනවල සහතික නිකුත් කිරීම, මහජන ප්‍රදර්ශන පැවැත්වීම, දේශන සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අරමුණු සහ කාර්යයන්ට අදාළ ප්‍රකාශ නිකුත් කිරීම, ශිල්පීය සේවාවන් සැපයීම, ක්ෂණික ඡායාරූප පිටපත් ලබා ගැනීම, අධිලේඛන සූක්ෂම ඡායාරූප ගත කිරීම ආදී සුවිශාල සේවාවන් රැසක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහනුවර ශාඛා කාර්යාලයට අනුබද්ධිතව ගෙන යන බැව් පර්යේෂණ ප්‍රතිඵල හරහා අනාවරණය විය. විඥාපනය අත්‍යාවශ්‍ය යුගයක තොරතුරු සුරක්ෂිතව තබා ගැනීම අත්‍යන්තයෙන්ම වැදගත් කරුණක් වන අතර මෙම ඓතිහසික ලේඛන අනාගත පරපුර සඳහා ස්ථිරව සංරක්ෂණය කිරීම අතිශය වදගත්ය. ඒ අනුව ඉතිහාස පර්යේෂණ සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මහනුවර ශාඛා කාර්යාලය තුළ තැන්පත් ලේඛන භාවිතය තුළින් සුවිශාල දායකත්වයක් ලබා දෙන බව මෙම පර්යේෂණ අධ්‍යයනය තුළින් මූලික වශයෙන් අනාවරණය කරගත හැකිවිය.

***ප්‍රමුඛ පද:*** *ඉතිහාස පර්යේෂණ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පර්යේෂණ සේවාවන්, මූලාශ්‍ර කළමනාකරණය*